ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகறிஸ் ஈவனியு, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

ෆැක්ස් / பெக்ஸ் / Fax : 684051
ඊමේල් / ஈ-மெயில் / E-mail : Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல / MY NO : 5/2/6/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / YOUR NO :
දිනය / திகதி / DATE : 2004.07. 20

චක්‍රලේඛ අංක:- 2004/04

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත හා ඉඩම් ප්‍රධාන (විශේෂ විධිවිධාන) පනත යටතේ දී ඇති ඉඩම්වලට දීමනාපත්‍ර සකස් කිරීම සඳහා ඉඩම් මැන සැලසුම් කිරීම</u>**

ඉහත කරුණ පිළිබඳව මගේ අංක 5/2/6/රත්නභූමි හා 2003.01.31 දිනැති 2003/2 චක්‍රලේඛයත්, 5/2/6/චක්‍රලේඛ හා 2003.10.01 දිනැති 2003/11 චක්‍රලේඛයත් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

එම චක්‍රලේඛවලින් ජයභූමි දීමනාපත්‍ර දී ඇති ඉඩම්වලටත්, මේ දක්වා බලපත්‍ර තත්ත්වයේ ඇති ඉඩම්වලටත් රේඛාචිත්‍ර ලබා ගැනීම සඳහා මැණුම් නියෝග නිකුත් කරන ලෙසට උපදෙස් දෙන ලද්දේ එම අවස්ථාවේ කෙටුම්පතක් වශයෙන් ඉදිරිපත් කර තිබූ ඉඩම් හිමිකම් පනත සම්මත වේ යැයි යන අපේක්ෂාවෙනි. එම පනත දැනට ඉදිරිපත් නොවන තත්ත්වයක ඇති බැවින් ජයභූමි දීමනාපත්‍ර නිකුත් කර ඇති ඉඩම් සඳහා රේඛාචිත්‍ර සකස් කලද එම රේඛාචිත්‍ර දීමනාපත්‍රය සමඟ සම්බන්ධ කිරීම සඳහා ක්‍රමෝපායක් දැනට නොමැති බැවින් එය සකස් කිරීම මෙම අවස්ථාවේදී ප්‍රමුඛතාවක් නොවනු ඇත.

මෙම තත්තවයද පැහැදිලි කරමින් මිණුම්පති වරයාද මා වෙත දන්වා ඇත්තේ ජයභූමි දීමනාපත්‍ර දී ඇති ඉඩම් මැනීමට පනතේ සංශෝධනයක් සිදුකර නොමැති නිසාත්, දැනට නීතිමය වශයෙන් රේඛාචිත්‍රවල අවශ්‍යතාවක් නොමැති වීම නිසාත්, එම ඉඩම් මෙම අවස්ථාවේදී මැනීමක් සිදු කිරීම අවශ්‍ය නොවන බවයි. එසේ වුවත් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දී ඇති බලපත්‍ර සහිත ඉඩම් සඳහා රේඛාචිත්‍ර සකස් කිරීමට මිණුම්පති වරයා එකඟතාවය පල කර ඇත. එම නිසා මගේ ඉහත චක්‍රලේඛවලින් දී ඇති උපදෙස් අනුව ජයභූමි දීමනාපත්‍ර සහිත ඉඩම්වලට රේඛාචිත්‍ර සකස් කිරීම සඳහා මැනුම් නියෝග නිකුත් කිරීම අත්හිටුවන්න. එහෙත් බලපත්‍ර අවස්ථාවේ ඇති ඉඩම් සඳහා නව දීමනාපත්‍ර සකස් කිරීමට අපේක්ෂා කරන්නේ රේඛාචිත්‍රයක්ද සමඟින් බැවින් එවැනි බලපත්‍ර සහිත ඉඩම්වලට රේඛාචිත්‍ර නිකුත් කිරීම සඳහා මැනුම් නියෝග නිකුත් කිරීමට ඔබගේ ප්‍රමුඛතාවය ලබා දෙන්න.

මේ වනවිටත් 2005 වසරේ මිණුම්පතිගේ වැඩ සටහන සඳහා අවශ්‍ය මිණුම් විස්තර ඔබගෙන් ඉල්ලා ඇති බව දැන ගැනීමට ඇති බැවින් 2004 වසරේදී නිමකර ගැනීමට නොහැකි වන්නේ නම් රේඛාචිත්‍ර සඳහා වූ මිණුම් විස්තර 2005 වසරට ඇතුළත් කර ගැනීමට කරුණාකර කටයුතු කරන්න.

[illegible]
ඉඩම් කොමසාරිස්.

පිටපත්:-
1. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය.
2. මිනුම්පති. - ඔබගේ අංක ඉතොප/1/163 හා 2004.07.14 දිනැති මා ඇමතු ලිපිය හා බැඳේ.
3. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් වෙත.
4. සියළුම අන්තර් පළාත් නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් වරුන් වෙත.